(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 441.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මාර්තු මස 17 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

4530/'13

1\.
ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආබාධිත රණවිරුවන් ස්වයං රැකියාවලට යොමු කිරීම සඳහා "රණවිරු දිවි නැගුම" නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ස්වයං රැකියා කවරේද;

(iii) ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා ලබා දෙන අවම සහ උපරිම ණය මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "රණවිරු දිවි නැගුම" ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදලක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

(ii) ඒ සඳහා ඉටු කළ යුතු ඇප, කොන්දේසි සහ ණය මුදල සඳහා අය කරනු ලබන පොලී අනුපාත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4579/'13

2\.
ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කැසිනෝ සූදුව වෙනුවෙන් 2012 සිට මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) මේ වන විට බලපත්‍ර රහිත කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන බවට වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එම කැසිනෝශාලා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4785/'14

3\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) වන අලි තර්ජන ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අලි තර්ජන ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින වන අලි තර්ජන අවම කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන අලි තර්ජන අවම කිරීම සඳහා අයවැය මගින් ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5020/'14

4\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ නගරයේ, මහවීදිය, සිරි කුරුස පාර හා මංගල පාර යන එක් එක් මාර්ගය පුළුල් කිරීම සඳහා අවසන් වරට ඉඩම් අත්පත් කර ගත් වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම අත්පත් කර ගත් ඉඩම් සඳහා මේ වන විට වන්දි ගෙවා තිබේ නම්, එම එක් එක් මාර්ගයට අදාළව වන්දි ගෙවන ලද වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයන්හි සංවර්ධන කටයුතු වෙනුවෙන් අත්පත් කර ගත් සියලු ඉඩම් භෞතික වශයෙන් මගී ජනතාවගේ පරිහරණයට යොදවා තිබේද;

(ii) එම මාර්ග සංවර්ධනය වෙනුවෙන් අත්පත් කරගෙන ඇතත්, මෙතෙක් මගී ජනතාවගේ පරිහරණයට යොදා නොගත් ඉඩම් තිබේද;

(iii) එසේ නම්, එවැනි ඉඩම් තිබෙන මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5443/'14

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2009 සිට 2013 දක්වා කාලය තුළ රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් අතරින් ගෘහ සේවයේ, කර්මාන්ත ශාලාවල සේවයේ සහ වෙනත් විවිධ රැකියාවන්වල යෙදී සිටියදී මිය ගිය සංඛ්‍යාව පිළිබඳව මෙම සභාව දැනුවත් කර තිබේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) විදේශ රැකියාවල යෙදී සිටියදී සැක කටයුතු ලෙස මිය ගිය අය පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5771/'14

6\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල-මාදම්පේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දුර ප්‍රමාණය සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වැය වෙන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත්වන පාර්ශ්වකරුවන් ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5856/'15

7.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රැකියා සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිසට අයත් කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී විදේශගත ශ්‍රමිකයන්ට මතුවන ගැටලු අවම කිරීමට ගනු ලබන කඩිනම් ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4532/'13

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අයවැය මගින් කළ යෝජනාවක් පරිදි ක්‍රියාත්මක වූ ආරක්ෂක අංශ සාමාජිකයින්ගේ පවුල්වල තුන්වැනි දරුවාගේ උපත වෙනුවෙන් රුපියල් ලක්ෂයක දීමනාවක් ලබාදීමේ වැඩපිළිවෙළ මේ වන විටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) තුන්වැනි දරු උපතකට අදාළව ආරක්ෂක අංශ සාමාජිකයෙකු විසින් ඉහත මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4787/'14

9\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය නිම කිරීම සඳහා පොලිස් නිලධාරීන් හා පොලිස් විශේෂ කාර්ය බලකාය ද සම්බන්ධ වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන් රණවිරුවන් සේ පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රණවිරුවන් දිරිමත් කිරීම සඳහා පවත්වනු ලබන "රණවිරු රියල් ස්ටාර්" තරගාවලියට පොලිස් නිලධාරීන් සහභාගී කර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5141/'14

10\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා මිනිස්බල සේවා සපයන ආයතන හරහා යොදවා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් සේවයේ යොදවා ගෙන සිටින කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය තුළ දී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා සෘජුවම බඳවා ගත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් බඳවා ගැනීමේදී පලපුරුදු සේවා කාලයක් සහිත, ඉහත (අ)(i) හි සඳහන් සේවකයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) 2014 වර්ෂයේදී බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව තුළ (අ)(i) හි සඳහන් සේවකයින්ගෙන් තේරී පත් වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5566/'14

11\.

ගරු අනුර දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට තාර ගෙන්වීමේ බලය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පමණක් හිමිව පැවතියේද;

(ii) එම බලය තවමත් එම සංස්ථාව සතුව පවතින්නේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අමතරව, වෙනත් සමාගම්වලට තාර ගෙන්වීමට අවසර දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම් කවරේද;

(v) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව පැවති එම බලය අහෝසි කළේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5860/'15

12\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය යටතේ පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කටයුතු කර ඇති බවත්;

(ii) ඒ යටතේ 2014 වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශාල මුදලක් සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii) හි සඳහන් කටයුතු යටතේ ක්‍රියාත්මක වූ සමහර වැඩ විෂයයන් අවසන් කර ඇති අතර, ඒ සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කර තිබේද;

(ii) අධික වර්ෂාව හේතුවෙන් ඇතැම් වැඩ විෂයයන් අතරමඟ නැවතී ඇති අතර, ඒ වෙනුවෙන් ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4788/'14

13\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් වර්ෂයක් තුළ යල සහ මහ කන්න දෙක වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) දැනට රට තුළ නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(iii) අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4820/'14

14\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතක සිට පිරිවෙන් ගුරුවරුන්ට මැතිවරණ රාජකාරිවල යෙදීම සඳහා අවස්ථාව ලබා නොදීමේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) 2010 හා 2011 වර්ෂයන්හි පැවති ජාතික මැතිවරණවල රාජකාරි සඳහා පිරිවෙන් ගුරුවරුන්ට අවස්ථාව ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඉදිරි පළාත් පාලන, පළාත් සභා සහ ජාතික මැතිවරණවලදී පිරිවෙන් ගුරුවරුන්ට මැතිවරණ රාජකාරීවල යෙදීමට අවස්ථාව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස්පති චක්‍රලේඛ 2416/2013 සහ ආයතන චක්‍රලේඛ 01/2013 යටතේ “2013 පොලිස් නිලධාරීන්ගේ දීමනා වැඩි කිරීමට” යටත් නොවන පොලිස් නිලධාරීන් කොට්ඨාස හෝ නිලධාරීන් සිටින්නේද;

(ii) එසේ නම්, එම පොලිස් නිලධාරී කොට්ඨාසයන් හෝ නිලධාරීන් කවරේද;

(iii) ඉහත චක්‍රලේඛ අනුව එම කොට්ඨාසයේ නිලධාරීන්ගේ දීමනා වැඩි නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලිස් ඉංජිනේරු සේවයෙහි යෙදෙන්නන් පොලිස් නිලධාන් ගණයට අයත් නොවන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

“සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

2.

මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— එක්සත් ජාතීන්ගේ පනත යටතේ නියෝග,— 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*13.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---